**ජාතික රක්ෂණ භාර අරමුදල - 2018**

**----------------------------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික රක්ෂණ භාර අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලටඅනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදලේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදලේ ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------------------- | -------------------------- | ----------- |
| (i) | LKAS 07 මුදල් ප්‍රවාහ ප්‍රකාශය ප්‍රමිතියෙහි 20 වන ඡේදය ප්‍රකාරව, මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය, විස්තීරණ ආදායම් ප්‍රකාශණය තුළ හෙලි කරන ලද ආදායම් සහ වියදම් සහ තොගවල හා මෙහෙයුම් සම්බන්ධ ලැබිය යුතු හා ගෙවිය යුතු අගයන්ගේ කාලපරිච්ඡේදයේ වූ වෙනස්වීම් පෙන්නුම් කිරීමෙන් ඉදිරිපත් කළ හැකි බව සඳහන්ව ඇති නමුත්, අරමුදලේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය තීරණය කිරීමේදී බදුපෙර ලාභය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශණය තුලින් නොගලපන ලද එකතුව රු.627,653,598 ක් වූ අයිතම 02 ක් සඳහා ගැලපීම් කර තිබුණි. | මෙය මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ දී සිදු වූ දෝෂයකි. මෙයින් මූල්‍ය ප්‍රතිඵලයට හෝ මූල්‍ය තත්වයට කිසිදු බලපෑමක් සි දු වී නොමැත. විස්තර පහත පරිදි වේ.<br><br>**Net fair value changes-Rs. 399,633,151**<br><br>මෙම අයිතමය මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය තුළ ගැලපීම් නොකොට ආයෝජන ක්‍රියාකාරකම් වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය තුළ ගැලපීමට ඉදිරියේ දී කටයුතු කරමු.<br><br>**Prior year adjustment- Rs. 228,020,447**<br>මෙම අයිතමය මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය තුල බදු පෙර ලාභයට ගැලපීම් නොකර මෙහෙයුම් වත්කම් හෝ මෙහෙයුම් බැරකම් වල වෙනස්වීම් ලෙස ගැලපීමට ඉදිරියේ දී කටයුතු කරමු. | ප්‍රමිතියට අනුකූලව ඉදිරිපත් කිරීම් කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ii) LKAS 16 දේපල පිරියත හා උපකරණ ප්‍රමිතියෙහි 40 වන ඡේදය ප්‍රකාරව, ප්‍රත්‍යාගණනයක ප්‍රතිඵලයක් වශයෙන් වත්කමක ධාරණ අගය අඩුවීමක් සිදුවන විටක එම අඩුවීම වියදමක් ලෙස හඳුනාගත යුතු බව සඳහන් වේ. එහෙත් අරමුදල 2018 වර්ෂයට අදාලව සිදුකරන ලද ප්‍රත්‍යාගණනයට අදාලව වත්කම්හි ධාරණ අගය රු.2,102,126 කින් අඩුවීම පෙර වර්ෂයන්ට අදාල ප්‍රත්‍යාගණන අතිරික්තයක් නොමැතිව අරමුදලේ ලාභය ගණනයේදී වියදමක් ලෙස හඳුනා නොගෙන වෙනත් විස්තීරණ ආදායමින් අඩුකර දක්වා තිබුණි. | 2018 වර්ෂයේ දි සිදුකරන ලද ප්‍රත්‍යාගණනයේ දී ප්‍රත්‍යාගණන ලාභයක් ඇති විය. මෙම වාහනය 2018/08/06 දින විකිණීමේ දී අදාළ ප්‍රත්‍යාගණන ලාභය ගිණුම්ගත කිරීමත්, අනෙකුත් වත්කම් ප්‍රත්‍යාගණනයේ දී සිදු වූ අලාභය විස්තීර්ණ ආදායමෙන් ගැලපීමත් යන කරුණු ද්විත්වය තුළින් මතුවන ශුද්ධ අගයන් ගලපා ඇත. | ප්‍රමිතියට අනුකූලව ඉදිරිපත් කිරීම් කළ යුතු වීම. |
| (iii) LKAS 01 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම ප්‍රමිතියෙහි 114 වන ඡේදයෙහි (ඇ) ප්‍රකාරව පරිශීලනය කරන්නන් හට මූල්‍ය ප්‍රකාශයේ තේරුම් ගැනීම සහ ඒවා අන් අස්ථිත්වයේ මූල්‍ය ප්‍රකාශ සමඟ සංසන්දනය කිරීම පහසුව සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ, විස්තීරණ ආදායම් ප්‍රකාශයේ, ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ යන ප්‍රකාශනයන්හි ඉදිරිපත් කර ඇති අයිතමවලට උපකාරක තොරතුරු එක් එක් ප්‍රකාශය සහ එක් එක් පේළි අයිතමය ඉදිරිපත් කර ඇති අනුපිළිවෙලට සටහන් මඟින් ඉදිරිපත් කල යුතු වේ. එසේම, LKAS 12 ආදායම් බදු ප්‍රමිතිය ප්‍රකාරවද ආදයම් බදු ගණනය කිරීම් පිළිබඳ හෙළිදරව් කිරීම කල යුතු බව වැඩි දුරටත් සඳහන් වේ. එසේ වුවද, අරමුදල ආදායම් බදු බැරකම සටහනක් මඟින් මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කර නොතිබීම හේතුවෙන් එම අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කළ බව තහවුරු නොවීය. | ඉදිරියේදී LKAS 12 ආදායම් බදු ප්‍රමිතිය ප්‍රකාරව හෙළිදරව් කිරීම් කිරීමට කටයුතු කරමු. | ප්‍රමිතියට අනුකූලව ඉදිරිපත් කිරීම් කළ යුතු වීම. |

## 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2018 වර්ෂය තුළදී කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත වන්දි ගෙවීම වෙනුවෙන් රු. 1,813,322,777 ක් ලබා දී තිබුණු අතර ඒ සඳහා අරමුදල විසින් වන්දි ගෙවීම් සඳහා වෙන් කිරීමේ ගිණුමක් හා වගා රක්ෂණ වන්දි සඳහා වගකීම් වෙනස්වීමේ ගිණුමක් පවත්වාගෙන යනු ලැබේ. මෙම ගිණුම් දෙකෙහිම නොවැම්බර් මස පමණක් ගණුදෙනු ඇතුළත් කර තිබුණු අතර දෙසැම්බර් මාසය සඳහා වෙන් කිරීම් ඇතුළත් කර නොතිබුණි. මේ හේතුවෙන්, මණ්ඩලය වෙත දෙසැම්බර් 14 හා 26 දින ගෙවා තිබූ නොවැම්බර් මාසයට අදාළ එකතුව රු. 62,761,857 ක් වගා රක්ෂණ වන්දි සඳහා වෙන් කිරීම් ගිණුමේ අවසාන ශේෂය ලෙස පෙන්නුම් කර තිබුණි. | 2018 දෙසැම්බර් මාසයේ දී අමතර වන්දි ගෙවීමේ අවශ්‍යතාවයක් පිළිබඳව AAIB ආයතනය විසින් දැනුම් දී නොතිබුණි. එබැවින් නොවැම්බර් මස කරනු ලැබූ වෙන්කිරීම් නොවෙනස්ව පවත්වාගෙන යාමට කටයුතු කර ඇත. | නිවැරදි තොරතුරු මත ගිණුම් පිළියෙල කළ යුතු වීම. |
| (ii) | ප්‍රතිරක්ෂණ අංශයෙහි 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වාරික ආදායම තුළ ආයතනයන් 03 කට අදාළ රු. 20,444,071 ක් වූ බැර ශේෂයක් පැවතුනු අතර ඊට අදාල ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙවැනි බැර ශේෂයන් ඇතිවිය හැක්කේ ලැබිය යුතු වාරික ආදායමට වඩා වැඩි ප්‍රමාණයක් රක්ෂණ වන්දි සඳහා ඔවුන් වෙත අයවීමට ඇති හෙයිනි. ශේෂයන් සැසඳීමට හා ඒ අනුව ක්‍රියාකිරීමටත් 2019 තුන්වන කාර්තුවේ සිට පියවර ගෙන ඇත. | නිරන්තර සැසඳීම් සිදුකරමින් ගිණුම් නිරවුල් කර ගත යුතු වීම. |
| (iii) | රක්ෂණ සමාගම් වලින් වැඩවර්ජන, කැරළි ගැසීම් සහ ජන කැළඹීම් හා ත්‍රස්තවාදී (SRCC & TR) අරමුදලේ රක්ෂණ වාරික අයකර ගැනීමට අදාළව (අරමුදලේ අභ්‍යන්තර විගණන වාර්තා මගින් පෙන්වා දී ඇති පරිදි) එක් සමාගමක වාරික විගණනයේදී අරමුදල වෙත ගෙවා තිබූ හා සත්‍ය වශයෙන් ගෙවිය යුතු වාරික මුදල් අතර රු. 8,490,385 ක වෙනසක් විය. | SRCC& TR රක්‍ෂණ වාරික අයකර ගැනිම සඳහා වඩා ක්‍රමවත් ක්‍රමවේදයක් තිබෙන අතර වාර්ෂිකව නිකුත් කරනු ලබන Limits & Rates for SRCC & TR ලේඛනයේ වාරික ගෙවිය යුතු ආකාරය පැහැදිලිව සඳහන් වේ. අභ්‍යන්තර විගණනය තුළින් ද ක්‍රමවේදයන් වඩාකාර්යක්‍ෂම හා නිවැරදිව කිරීම නිරීක්‍ෂණය කරන අතර එම නිරීක්‍ෂණයන් ද වාරික එකතු කිරීමෙහි ලා ක්‍රියාත්මක වන තවත් ක්‍රමවේදයකි. | නිසි ක්‍රමවේදයක් මත වාරික අයකර ගැනීම් සිදුකල යුතු වීම. |
| (iv) | ප්‍රතිරක්ෂණ අංශයෙහි ලැබිය යුතු වාරික ආදායමට අදාල ලෙජර ගිණුම් ශේෂය හා ණයගැති කාල විශ්ලේෂණය අතර රු. 9,072,974 ක වෙනසක් විය. | ලැබිය යුතු ප්‍රතිරක්‍ෂණ වාරිකයේ ලෙජර ශේෂය සහ කාලවිශ්ලේෂණය අතර වෙනස සඳහා වන හේතුන් පහත පරිදි වේ.<br>**(අ)** AAI මෙම ශේෂය 2012 වර්ෂයේ | නිරන්තර සැසඳීම් සිදුකරමින් ගිණුම් නිරවුල් කර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | සිට පැවත එන අතර බොහෝ විට ගෙවිය යුතු වන්දි ඉල්ලීම් හෝ වාරික ලබාගැනීම් පියවනු ලබන්නේ ලැබිය යුතු ශේෂ හා ගෙවිය යුතු ශේෂය හිලව් කිරීම තුළිනි. මෙම ශේෂය ලියා ගැනිම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත<br>**(ආ)** AAI සහ MBSL සමාගම් වලට ආපසු ගෙවිය යුතු මුදල රු. 2,101,338.06 2019 පෙබරවාරි මස නිවැරදි කරන ලදී.<br>**(ඇ)** හඳුනාගත නොහැකි ශේෂය ලෙස, රු.19,610.19/- ක් වූ මෙම ශේෂය ද දීර්ඝ කාලයක් තිස්සේ පැවත එන අතර ලියා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යොමු කර ඇත. | |
| (v) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්ගේ දෛනික මුදල් තැන්පතු දිනයන් හා පද්ධති ලදුපත් නිකුත් කර ඇති දිනයන් අතර සැලකිය යුතු කාල පරතරයක් පැවතීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනයන්හි 2018 වර්ෂයේ ආදායමට බැර විය යුතු රු.2,502,302 ක වටිනාකමක් 2019 වර්ෂයේ ආදායමක් වශයෙන් හඳුනාගෙන තිබුණි. | මෙම දුර්වලතාවයන් අවම කිරීම සඳහා මේ වන විටත් පියවර ගෙන ඇති අතර ඉදිරියේදී මෙවැනි අඩුපාඩු මග හැරී යනු ඇත. | නිවැරදි ආදායම් ගිණුම් ගත කළයුතු වීම. |
| (vi) | අරමුදල හා ප්‍රතිරක්ෂණ ආයතනය අතර 2018.03.31 දින සිට 2019.03.31 දින දක්වා ඇති කර ගත් ප්‍රතිරක්ෂණ ගිවිසුම අනුව, රු.98,670,792 ක වාර්ෂික වාරිකයන් ගෙවනු ලබන අතර ඉන් කාර්තුවක වාරික වටිනාකම රු.24,667,698 ක් වුවද නොඉපයූ වාරික ලෙස රු. 24,329,784 ක් වෙන් කිරීම හේතුවෙන් නොඉපයූ වාරික - වගා ප්‍රතිරක්ෂණ ගිණුම හා නොඉපයූ වාරික සංචිත ගිණුම් තුළ රු. 337,914 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මෙය ගණනය කිරීමේ පදනමේ ඇති වූ දෝෂයකි. නොඉපයූ වාරික ආදායම ගිණුම්ගත කිරීමේ දී දින 365 පදනම භාවිතා කර ඇති අතර මෙවැනි දෝෂ අවම කිරීම සඳහා ඉදිරියේ දි පියවර ගැනීමට සටහන් කර ගතිමු. | නිවැරදි තොරතුරු මත ගිණුම් පිළියෙල කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (vii) | එක් ප්‍රතිරක්‍ෂණ ආයතනයක් විසින් විගණනයට ඉදිරිපත් කල සෘජු ශේෂ සනාථන අනුව 2018 දෙසැම්බර් 31 දිනට අරමුදල වෙත ගෙවිය යුතු මුදලක් නොමැති බව දක්වා තිබුණද අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල රු.147,376,867 ක් එම ආයතනයෙන් ලැබිය යුතු ලෙස දක්වා තිබීම හේතුවෙන් ශේෂ සනාථන හා මූල්‍ය ප්‍රකාශන අතර රු. 147,376,867 ක වෙනසක් විය. | අපගේ ගිණුම් පොත්පත් අනුව SIB ආයතනයෙන් 2016 ඇතිවූ ගංවතුර හේතුවෙන් අයවිය යුතු ප්‍රතිරක්ෂණ වන්දි මුදල රු. 1,147,376,867 ක් වේ. එම මුදල අදාළ ප්‍රතිරක්ෂණ සමාගම් විසින් SIB ආයතනය වෙත ප්‍රේෂණය කර බවද විදේශීය ප්‍රතිරක්ෂණ තැරැව්කරු විසින් සහතික කර ඇත. එබැවින් එම ශේෂය නිවැරදි බව තහවුරු කරමු. SIB ආයතනය තවදුරටත් රු. මිලියන 19,993,473 ක මුදලක් අප ආයතනය වෙත ගෙවීමට ඇති බව දන්වා සිටිමු. | නිවැරදි තොරතුරු මත ගිණුම් පිළියෙල කළ යුතු වීම. |
| (viii) | එසේම එම ශේෂ සනාථන අනුව, 2018දෙසැම්බර් 31දිනට අදාලව අරමුදලෙන් ලැබිය යුතු ශේෂය රු 309,562,948 .ක් විය .එසේ වුවද , අරමුදලේ මූල්‍ය ප්‍රකාශන අනුව , ගෙවිය යුතු ලෙස එවැනි මුදලක් ඇතුළත් කර නොතිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන හා ශේෂ සනාථන අතර රු309,562,948 . ක වෙනසක්ද විය. | 2018.12.31 දින වන විට රු. 309,562,948 ක් වන මුදලක් ගෙවීමට අපගේ ගිණුම්පොත් අනුව නොමැති බව ප්‍රකාශ කරමි. | නිවැරදිව සැසඳීම් කර ගැටලුව නිරාකරණය කළ යුතු වීම. |
| (ix) | මූල්‍ය ප්‍රකාශනවල අරමුදලේ ආයෝජන ආදායම ලෙස දළ ආදායම දැක්විය යුතු වුවද ශුද්ධ ආදායම ගිණුම්වල ඇතුළත් කර තිබුණි. ඊට අදාළව වර්ෂය අවසානයේදී ගැලපීම් සිදු නොකිරීම හේතුවෙන් ආයෝජන ආදායම රු.128,781,294 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | පිළිතුරු සපයා නැත. | නිවැරදි තොරතුරු මත ගිණුම් පිළියෙල කළ යුතු වීම. |
| (x) | මූල්‍ය ප්‍රකාශන තුල ඇතුළත් රු.33,593,020 ක් වූ ආපදා ණය ශේෂය, විගණනයට ඉදිරිපත් කරන ලද උපලේඛන අනුව රු. 34,364,395ක් වීම හේතුවෙන් රු. 771,375 ක වෙනසක් විය. | මූල්‍ය ප්‍රකාශ අනුව ශේෂයත් ලේඛන අනුව ශේෂයත් අතර පෙර වසර සිට පවතින වෙනසත් ඇති අතර එය ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමු. | නිවැරදිව සැසඳීම් කර ගැටලුව නිරාකරණය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (xi) | වෙනත් මූල්‍ය නොවන වත්කම් තුල ඇතුළත් රු. 773,506 ක් වූ උත්සව අත්තිකාරම් ශේෂය, විගණනයට ඉදිරිපත් කරන ලද උප ලේඛන අනුව රු. 616,702 ක් වීම හේතුවෙන්, මූල්‍ය ප්‍රකාශන හා ලේඛන අතර රු. 156,804 ක වෙනසක් විය. | මූල්‍ය ප්‍රකාශ අනුව ශේෂයත් ලේඛන අනුව ශේෂයත් අතර කලක සිට පවතින වෙනසක් ඇති අතර එය ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමු. | නිවැරදිව සැසදීම් කර ගැටලුව නිරාකරණය කළ යුතු වීම. |

**1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විෂය | මුදල<br><br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (i) | ප්‍රතිරක්‍ෂණ ආයතන විසින් ලැබිය යුතු මුදල් | 1,321,391,889 | සෘජු ශේෂ සනාථන ලිපි | ඔබ විසින් මේ සම්බන්ධයෙන් කරනු ලැබූ විමසීමට පසු අදාල පාර්ශවයන්ගෙන් ශේෂ සනාථන කැඳවීමට කටයුතු කර ඇත. | සෘජු ශේෂ සනාථන ලිපි ඉදිරිපත් කළයුතුවීම. |
| (ii) | ලැබිය යුතු මුදල් - ප්‍රතිරක්ෂණ | 9,053,364 | විස්තරාත්මක උපලේඛන | 2012 වර්ෂය හා ඊට පෙර සිට පැවත එන ශේෂයන් වන අතර අදාල කිසිදු ලියවිල්ලක් හෝ සාක්‍ෂියක් නොමැති බැවින් ලියා හැරීමට අධ්‍යක්‍ෂක මණ්ඩලයට පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමු. | විධිමත් පරිදි තත්ත්වය නිරාකරණය කළ යුතු වීම. |
| (iii) | අන්තර් දෙපාර්තමේන්තු ගනුදෙනු - ආපදා ණය ශේෂ | 3,462,112 | නිරවුල් කල බවට සාක්ෂි | 2012 වර්ෂය හා ඊට පෙර සිට පැවත එන ශේෂයන් වන අතර අදාල කිසිදු ලියවිල්ලක් හෝ සාක්‍ෂියක් නොමැති බැවින් විගණනය වෙත ඉදිරිපත් කිරීමට නොහැකි විය. ලියා හැරීමට අධ්‍යක්‍ෂක මණ්ඩලයට පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමු. | විධිමත් පරිදි තත්ත්වය නිරාකරණය කළ යුතු වීම. |
| (iv) | Cheque Return – Car ACC Motor | 585,481 | මූලාශ්‍ර ලියවිලි | 2012 වර්ෂය හා ඊට පෙර සිට පැවත එන ශේෂයන් වන අතර අදාල කිසිදු ලියවිල්ලක් හෝ සාක්‍ෂියක් නොමැති බැවින් විගණනය වෙත ඉදිරිපත් කිරීමට නොහැකි විය. ලියා හැරීමට අධ්‍යක්‍ෂක මණ්ඩලයට පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමු. | විධිමත් පරිදි තත්ත්වය නිරාකරණය කළ යුතු වීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (v) | ගෙවිය යුතු තැන්පතු | 270,049 | විස්තරාත්මක තොරතුරු | 2012 වර්ෂය හා ඊට පෙර සිට පැවත එන ශේෂයන් වන අතර අදාල කිසිදු ලියවිල්ලක් හෝ සාක්ෂියක් නොමැති බැවින් විගණනය වෙත ඉදිරිපත් කිරීමට නොහැකි විය. ලියා හැරීමට අධ්‍යක්ෂක මණ්ඩලයට පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමු. | විධිමත් පරිදි තත්ත්වය නිරාකරණය කළ යුතු වීම. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2015 | උත්සව අත්තිකාරම් වශයෙන් ලබා දිය හැකිඋපරිම මුදල් රු. 10,000 ක් වුවද, අරමුදල විසින් එම සීමාව නොසළකා කාර්ය මණ්ඩලයෙහි 117 දෙනෙකු සඳහා මූලික වැටුප පදනම් කර ගනිමින් උත්සව අත්තිකාරම් ලෙස රු. 3,229,139 ක් ගෙවා තිබුණි. | ආයතනය ආරම්භයේ පටන් උත්සව අත්තිකාරම් ලෙස මාසික මූලික වැටුප ලබා දීම සඳහා කටයුතු කර ඇති අතර, ඒ අනුව 2018 වර්ෂයේ දී ද අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත උත්සව අත්තිකාරම් ලබා දීම සිදු කර ඇත. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ක්‍රියාකල යුතු වීම. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයෙහි මුදල් රෙගුලාසි 371 | ලබාගන්නා තත්කාරය අතුරු අග්‍රිමය එය දෙන ලද කාර්යය නිමකල වහාම නැවත පියවියයුතු වුවත් 2018 වර්ෂයේ නිකුත් කර ලද රු. 448,000 ක් වූ උප අග්‍රිම 13 ක් පියවීම සඳහා මාස 01 සිට මාස 4 ½ ක දක්වා කාලයක් ගතවී තිබුණි. | තත්කාර්ය අතුරු අග්‍රමය දෙන ලද කාර්යය නිම කළ පසු පියවියයුතු වූව ද ලබා ගත් තත්කාර්යඅතුරු අග්‍රමයන්ගෙන් උප අග්‍රම 13ක් පියවීම ප්‍රමාද වී ඇති අතර ඉදිරියේ දී ප්‍රමාදයන් අවම කිරීමට පියවර ගෙන ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියාකල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) මු.රෙ. 396 | 2018 වර්ෂයේ ගෙවිය යුතු නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් වටිනාකම් රු. 60,752,249 ක් වන අතර එය 2017 වර්ෂයට සාපේක්ෂව රු. 53,891,837 කින් එනම් සියයට 786 කින් ඉහළ ගොස් තිබුණි. ඒ තුල ඇතුළත් 2017 වර්ෂයේ ජාතික ආපදා රක්ෂණ වැඩසටහනට අදාළව නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් වල වටිනාකම් රු.57,436,510 ක් විය. එම චෙක්පත් නිකුත් කළ දින සිට වර්ෂයක පමණ කාලයක් ගත වී තිබුණි. | NNDIS චෙක්පත් සඳහා වලංගු කාලය අවසන් වූ ඉදිරිපත් නොවූ චෙක්පත් නැවත වලංගු කර ගැනීම සඳහා කඩිනමින් අප වෙත එවන ලෙස ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත දැනුම් දි ඇති අතර ඒ අනුව දැනටමත් ඔවුන් ඒ සඳහා කටයුතු කරමින් පවතී. තව ද දින දීර්ඝ කර ගැනිම සඳහා ආයතනය වෙත එවන ලද චෙක්පත් දින දීර්ඝ කර කඩිනමින් ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත යවා ඇතත් ඒවා රක්‍ෂණලාභින් වෙත ලැබී නොතිබීම හේතුවෙන් මෙම ගිණුමේ ශේෂය ඉහළ ගොස් ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියාකල යුතු වීම. |
| (ඈ) මු.රෙ. 139 හා මු.රෙ. 187 | වවුචර් සඳහා චෙක්පත් මඟින් ගෙවීම් කිරීමේදී ගෙවීම් කරනු ලබන නිලධාරියා විසින්, බැංකු ශේෂය සියලුම ගෙවීම් පියවා ගැනීම සඳහා ප්‍රමාණවත් බවට සහතික විය යුතු වුවත් එලෙස බැංකු ශේෂය පිළිබඳව සැලකිලිමත් වීමකින් තොරව චෙක්පත් නිකුත් කිරීම නිසා 2018 දෙසැම්බර් 31 දිනට නිකුත් කල නමුත් ඉදිරිපත් නොකරන ලද චෙක්පත් වටිනාකම රු. 9,837,431 ක් වූ අතර එදිනට බැංකු ශේෂය රු. 6,224,696 ක් විය. එම චෙක්පත් එදිනට නිශ්කාශනය වූයේ නම් රු. 3,612,734 ක බැංකු අයිරාවක් ඇතිවන බව නිරීක්ෂණය විය. | ලංකා බැංකුව අංක 82727165 දරණ ජංගම ගිණුමේ 2018 දෙසැම්බර් 31 දිනට මුදල් පොත අනුව ශේෂය බැංකු ගිණුම අනුව ශේෂයත් අතර වෙනසක් පවතී. මෙය මුදල් පොතට අනුව අවාසිදායක ශේෂයක් වුව ද සත්‍ය බැංකු ශේෂය වාසිදායක ශේෂයකි. මෙය නාමික බැංකු අයිරාවක් පමණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අවධානම අවම කර ගත යුතුය. |
| (ඉ) 2008 මාර්තු 25 දිනැති අංක 1542/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ 04 ඡේදය | ඡේදයේ සඳහන් වියදම්වලට පමණක් වැඩවර්ජන, කැරළි ගැසීම් සහ ජන කැළඹීම් හා ත්‍රස්තවාදී අරමුදල පිළිබඳ (SRCC) විශේෂ ගිණුමේ ඇති මුදල් භාවිතා කළ හැකි වුවත් එපරිදි කටයුතු නොකර 2018 හා 2019 වර්ෂ සඳහා ඊට අදාළ නොවන වියදම් සඳහා එකතුව රු.69,708,220 ක මුදල් භාවිතා කර තිබුණු බව නිරීක්ෂණය විය. | SRCC හි අරමුදල් වන්දි ගෙවීම් ප්‍රතිරක්‍ෂණ වාරික ගෙවීම් සඳහා සේවක වැටුප් හා වේතන පරිපාලන වියදම් නඩත්තු කිරීම් හා අනෙකුත් වියදම් සහ ගොඩනැගිලි කුලී යනාදිය සඳහා යොදා ගෙන ඇති බව පෙන්වා දෙන්නෙමු. | අතිවිශේෂ ගැසට් නිවේදනයේ උපදෙස් අනුව ක්‍රියාකල යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) NNDIS හිමිකම් ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේ මාර්ගෝපදේශය | ස්වාභාවික විපත්වලට එරෙහිව රක්ෂණාවරණය ලබා දීම සඳහා අරමුදල විසින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ආපදා රක්ෂණ යෝජනා ක්‍රමයට අදාළ මාර්ගෝපදේශය අනුව ක්‍රියා කර නොමැති පහත අවස්ථා නිරීක්ෂණය විය. | | | |
| | (i) | අදාළ හිමිකම් අයදුම්පත් සඳහා ප්‍රාදේශීය ලේකම්තුමාගේ අත්සන් සහ රබර් මුද්‍රාව නොමැතිව ඉදිරිපත් කිරීම | ඉතාමත් සුළු ප්‍රමාණයක අයදුම්පත් වල අත්සන හෝ රබර් මුද්‍රාව හා අත්සන නොමැති වූව ද එම අයදුම්පත් එකතුව පරීක්ෂා කිරීමේ දී රබර් මුද්‍රාව හා අත්සන ඇති අයදුම්පත් වල රබර් මුද්‍රාවට හා අත්සනට සමාන නිසා සහ එම කාලපරිච්ඡේදය තුළ අයදුම්පත් විශාල ප්‍රමාණයක ගෙවීම් කටයුතු කාර්යක්ෂමව සිදුකල යුතු නිසා අත්සන හා රබර් මුද්‍රාව පමණක් සංසන්දනාත්මකව පරීක්ෂා කිරීමෙන් අනතුරුව ගෙවීම් කටයුතු සිදුකරන ලදී. | විධිමත් මාර්ගෝපදේශයක් මත ගෙවීම් කළ යුතු වීම. |
| | (ii) | රු. 500,000 ඉක්මවන හිමිකම් අයදුම්පත් සම්බන්ධව අවධානම් ඉන්ජිනේරුවරයෙකු මඟින් තක්සේරු කිරීම අවශ්‍ය වුවද, අරමුදල විසින් එසේ සිදු කර නොමැති වීම | රු.500,000.00 ඉක්මවන හිමිකම් අයදුම්පත් සම්බන්ධයෙන් ද අදාල නිවාස කමිටුව විසින් තක්සේරු කිරීම් සිදුකරන ලද අතර මේ දක්වාම ඉහල වටිනාකමකින් යුත් අයදුම්පත් සඳහා ගෙවීම් කටයුතු සිදු කිරීමට පෙර අවදානම් ඉංජිනේරුවරයකු ඒ සඳහා යොමු කිරීමට කටයුතු සලසා ඇත. | මාර්ගෝපදේශයට අනුකූලව ක්‍රියා කළ යුතු වීම. |
| | (iii) | හිමිකම් අයදුම්පත් සම්පූර්ණ කර ඉදිරිපත් කිරීමේදී අදාළ හිමිකම්ලාභියා සම්බන්ධව ප්‍රමාණවත් ලේඛන ඉදිරිපත් නොවීම. | විපතටපත් දේපලට අදාළ අයිතිය තහවුරු කිරීමේ දී ඔප්පු වලට පමණක් සීමා නොවී නිවාස කමිටු නිළධාරීන් සහ ප්‍රාදේශිය ලේකම් විසින් අනුමතකල ලියවිලි සලකා බලා ගෙවීම් කටයුතු සිදුකල අතර ඡායාරූප ලබා ගත නොහැකි ඇතැම් අයදුම්පත් සඳහා ද අදාළ නිලධාරීන්ගේ අනුදැනුම ඇතිව සානුකම්පිතව සලකා බලා ගෙවීම් කටයුතු සිදුකළ නමුත් මේ වන විට සියළු ගෙවීම් සිදු කිරීමට පෙර සෑම ලියවිල්ලක්ම ප්‍රමාණවත් ලෙස පරීක්ෂාකර බැලීම සිදු කෙරේ. | මාර්ගෝපදේශයට අනුකූලව ක්‍රියා කළ යුතු වීම. |
| | (iv) | ස්වාභාවික ආපදා රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ තාවකාලික වාසස්ථාන, කුටි හෝ වෙනත් ස්ථිර නොවන රාමු යටතේ සකස් කරන ලද ඉදි කිරීම් සඳහා වන්දි නොගෙවනු ලැබුවත් අරමුදල විසින් එසේ ගෙවා නොතිබීම. | මෙම ගෙවීම් සඳහා වරිපනම් අංක සහ වරිපනම් කොට්ඨාශ යටතේ ලියාපදිංචි වූ වාසස්ථාන වලට පමණක් ගෙවා ඇත. මෙම රක්ෂණ ක්‍රමවේදයේ මූලික අභිප්‍රාය වන්නේ ආර්ථික වශයෙන් අවදානම් කලාපයේ සිටින පුරවැසියන් ආරක්ෂා කිරීමයි. | නීතිරීති ප්‍රකාරව ගෙවීම් කළ යුතු වීම. |

## 2. මෙහෙයුම් සමාලෝචනය

### 2.1 අනාර්ථික ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයෙන් 2018 පෙබරවාරි 02 දින රු. 290,000,000 ක් ඉල්ලුම් කර තිබුණු අතර අරමුදල විසින් ඒ සඳහා සියයට 7.15 පොලියකට ආයෝජනය කරන ලද රු. 780,000,000 ක වටිනාකමකින් යුත් ස්ථාවර තැන්පතුවක් කල් පිරීමට පෙර වගා බදු ජංගම ගිණුමට මාරුකරගෙන තිබුණි. ඉන් රු. 149,134,697 ක වටිනාකමක් රඳවාගෙන රු. 140,865,303 ක් පමණක් නිදහස් කර තිබුණි. | කෙටිකාලීන තැන්පතු නොතිබූ බැවින් ඉදිරි කාලපරිච්ඡේදයක තැන්පතු කල්පිරිමට පෙර (Pre-mature)ගිණුමට මාරුකර කඩිනමින් වන්දි කිරිමට කටයුතු කර ඇත. | විධිමත් ක්‍රම වේදයක් මත ක්‍රියා කළ යුතු වීම. |
| (ii) | එසේම කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයෙන් රු. 250,380,277 ක් නැවත වරක් ඉල්ලුම් කර තිබුණ අතර මණ්ඩලය විසින් 2018 නොවැම්බර් 01 දින සියයට 8.55 පොලියට ආයෝජනය කරන ලද රු. 97,000,000 ක ස්ථාවර තැන්පතුවක් කල් පිරීමට පෙර වගා බදු ජංගම ගිණුමට මාරු කර ඉන් රු. 21,675,815 ක් රඳවාගෙන රු. 75,324,185 ක මුදලක් පමණක් ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත නිදහස් කර තිබුණි. | | විධිමත් ක්‍රම වේදයක් මත ක්‍රියා කළ යුතු වීම. |
| (iii) | තැපැල් හා විදුලි සංදේශ නිළධාරීන්ගේ සංගමය (The Union of post and Telecommunication officers) සහ ජාතික රක්ෂණභාර අරමුදල අතර ඇතිකර ගත් ගිවිසුම ප්‍රකාරව, අරමුදල මගින් රු. 39,600,000 ක තැන්පතුවක් සංගමය වෙත තබා ඇති අතර මෙම අරමුදල් වෙනත් ආයෝජන මාර්ගයක යොදවා ප්‍රතිලාභ ඉපයීමට තිබූ අවස්ථාව අරමුදල විසින් අහිමි කර ගෙන තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව මූලික තැන්පතුවකින් තොරව ගොඩනැගිල්ලක් රඳවා ගැනිමට නොහැකි බැවින් අමාත්‍ය මණ්ඩලයේ ද අනුමැතිය මත තැන්පතු මුදල් තැපැල් හා විදුලි සංදේශ නිළධාරීන්ගේ සංගමය වෙත නිදහස් කරන ලදී. | අරමුදල් උපරිම කාර්යක්ෂමතාව යෙන් භාවිතා කළ යුතු වීම. |

## 2.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | අරමුදලේ ප්‍රතිරක්ෂණ අංශයෙහි 2015 වර්ෂයට අදාළව විකුණුම් ඉන්වොයිස් මත ගෙවිය යුතු වූ රු. 42,434,299 ක් කොමිස් මුදල විගණිත දිනය වූ 2019 මැයි 06 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | ප්‍රතිරක්ෂණ අංශයේ ඉන්වොයිස් සඳහා ලැබිය යුතු වාරික ආදායම් මුදල් අදාළ ආයතනයන්ගෙන් නොලැබීම හේතුවෙන් මෙම ගෙවිය යුතු කොමිස් මුදල් හිලව් කර ගැනීම සිදු කළ නොහැකි වී ඇත. මෙය ද ලියා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර ඇත. | ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ii) | 2018 දෙසැම්බර් 31 දිනට සාමාන්‍ය රක්ෂණය - මෝටර් නොවන අංශයෙහි ලැබිය යුතු වාරික ආදායමට අදාලව ශේෂ පත්‍ර දිනට පසු ලැබීම් පිළිබඳ සිදුකල පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි 2019 මාර්තු මාසය වන විටත් රු.5,730,959 ක හිඟ ශේෂ පැවතුණි. | 2019.03.31 වන විට රු. 31,474,963.35 ක මුදලක් අයකර ගෙන ඇත. ඉතිරි ලැබිය යුතු ආදායමට අදාලව ඒවායෙහි අයවිය යුතු ශේෂයන් සඳහා අදාළ රක්ෂිතයන් දැනුවත් කිරීම් කරනු ලැබේ. ඉදිරියේ දී මෙම ශේෂයන් අයකර ගැනීමට තවදුරටත් කටයුතු කරනු ලැබේ. | ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (iii) | 2007 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වැඩවර්ජන, කැරළි ගැසීම් සහ ජන කැළඹීම් හා ත්‍රස්තවාදී (SRCC) අරමුදලට අදාළව නිරවුල් නොකළ රු.18,509,275 ක හිමිකම් ගෙවීම් (Non Motor) විගණිත දිනය වූ 2019 ජූලි 31 දින වන විටත් නිරවුල් නොවී පැවති බව නිරීක්ෂණය විය. | මෙතෙක් නිරවුල් නොකළ හිමිකම් ගෙවීම් ගිණුම් පොත් වලින් කපා හැරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමට පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගනු ඇත. | ශේෂ විධිමත්ව නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (iv) | අග්‍රහාර රක්ෂණ සාමාජිකයින් පිළිබඳ තොරතුරු ඇතුළත් විධිමත් දත්ත පද්ධතියක් (Data base) නඩත්තු කිරීමට අරමුදල කටයුතු කර නොතිබීමත්, ගෙවිය යුතු හිමිකම් අදාළ වන්දි ඉල්ලුම්කරුවන්ට නිරවුල් කිරීමේ ක්‍රමවේදයේ ඇති දුර්වලතාවයන් හේතුවෙනුත් 2019 මැයි වන විටත් රු.8,319,124 ක නිරවුල් නොකරන ලද ශේෂ පැවතුණි. | වර්ෂයකට රුපියල් මිලියන 5,500 ක පමණ මෙලෙස අන්තර් බැංකු ගෙවීම් (SLIP) ඔස්සේ ගිණුම් වෙත සෘජුව බැර කරන අතර ඉන් 0.1% පමණ ප්‍රමාණයක් බැර නොවී ආපසු retun වේ. එබැවින් අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියකින් පසුව ඒ සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමු. | විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු වීම. |
| (v) | අරමුදලේ SRCC අංශයට අදාලව 2007 වර්ෂයේ සිට පැවත එන රු. 3,843,488 ක ආපසු ගෙවිය යුතු වාරික මුදල් ශේෂය 2019 මැයි 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | වර්ෂ ගණනාවක සිට පවතින මෙම ශේෂය කපා හැරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගනු ඇත. | ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (vi) | අග්‍රහාර වන්දි ගෙවීම් වෙනුවෙන් නිකුත් කරන ලද චෙක්පත් අවලංගු වීම හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂයක් ලෙස හඳුනාගන්නා ලද රු. 2,632,770 ක ශේෂය විගණිත දිනය වූ 2019 මැයි 08 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | ශේෂයන් කඩිනමින් ලබා ගැනීමට කටයුතු යොදා ඇති බවත් ඉදිරි වසර සඳහා රාජ්‍ය ආයතන දැනුවත් කරමින් ඒ සඳහා වූ ක්‍රියාමාර්ගයන් ගෙන ඇති බවත් දන්වා සිටිමු. | විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කරමින් ශේෂ නිරවුල් කල යුතු වීම. |
| (vii) | 2015 වර්ෂය අවසානයේ රු. 1,073,351 ක් ලෙස පැවතුණු අරමුදල විසින් රක්ෂණ ප්‍රතිලාභීන්ට ගෙවිය යුතු ශේෂය, 2016, 2017 හා 2018 වර්ෂ අවසානයේ රු. 1,513,897 ක් ලෙස නොවෙනස්ව පැවතුණි. ඒ අනුව වසර 04 කට අධික කාලයක සිට පැවත එන මෙම අගය නිරවුල් කිරීමට අරමුදල කටයුතු කර නොතිබුණි. | Slip return control crop insurance ගිණුමේ පවතින ශේෂය සඳහා ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධව අධ්‍යක්ෂක මණ්ඩලය වෙත දැනටමත් පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (viii) | 2018 දෙසැම්බර් 31 දින වන විට අරමුදලේ වගා රක්ෂණ ගිණුමේ රු.1,640,828,796 ක ශේෂයක් පැවතිය යුතු වුවද අරමුදලේ මූල්‍ය කළමණාකරු විසින් විගණනයට ලබාදුන් වාර්තාව අනුව, 2018 දෙසැම්බර් 31 දිනට අරමුදලේ ඉතිරි ශේෂය රු. 1,641,687,854 ක් විය. මෙම මුදලින් උපයෝජනය වන වත්කම් පිළිබඳව විගණනය විසින් විමසූ අතර ඒ සඳහා ඉදිරිපත් කල තොරතුරු අනුව, ඉන් රු. 1,462,969,344 ක ශුද්ධ අගයක් වෙනත් රක්ෂණ අංශ වෙත නිකුත් කල මුදල් බව නිරීක්ෂණය විය.එසේ වුවද, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ 2017 ජුනි 28 දින නිකුත් කළ උපදෙස් මාලා අංක IBSL/DG/SUP/17/06/233 අනුව, එක් එක් අංශයන්හි අරමුදල් ඒවා ස්ථාපිත කිරීමේ අරමුණ උදෙසා යොදා ගතයුතු බවට උපදෙස් ලබා දී තිබුණි. | එම අගය අන්තර්ගත වී ඇත්තේ වෙනත් රක්ෂණ අංශවලට නිකුත් කළ මුදල් තුළය. තාවකාලික අරමුදල් අවශ්‍යතාවයන් සඳහා එක් එක් අංශ අතර අරමුදල් හුවමාරුකර ගැනීම ඕනෑම ආයතනයක සාමාන්‍ය ක්‍රමවේදය වන අතර අප ආයතනය ද එසේ වගා බදු අරමුදලෙන් රක්ෂණ වන්දි ගෙවීම සඳහා අනෙකුත් අංශ වෙත අරමුදල් ලබා දී ඇත. | නීතිරීති ප්‍රකාරව ගෙවීම් කළ යුතු වීම. |
| (ix) | අරමුදල විසින් වගා බදු ගෙවිය යුතු ආයතනවලට කාර්තු හා වාර්ෂික පදනමින් ආකෘති පත්‍රයක් ලබා දෙන අතර ගෙවීම් ප්‍රමාද කරන අයට දඩ මුදල් පිළිබඳ දන්වා ලිපිද යවනු ලබයි. කෙසේ වුවද, අයකර ගත් දඩ මුදල වගා රක්ෂණය - බදු ආදායම් ගිණුමෙහි ගිණුම්ගත කිරීම හැර අයකර ගත් දඩ මුදල් වෙනමම ගිණුමක ගිණුම්ගත | අයකර ගත් දඩ මුදල් සඳහා වෙනම ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබුණ ද ලැබී තිබූ දඩ මුදල් ගිණුම්ගත කර තිබිණ. කෙසේ වෙතත්, 2019 වර්ෂයේ සිට දඩ මුදල් ගිණුම්ගත කිරීම සඳහා වෙනම ලෙජර් ගිණුමක් විවෘත කර ඇත. ලැබිය යුතු දඩ මුදල් ක්‍රමවත්ව ගිණුම්ගත කිරීමට ඉදිරියේ දී කටයුතු කරමු. | විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | කිරීමට, ලැබිය යුතු දඩ මුදල් ගණනය කර ගිණුම්ගත කිරීමට හෝ බදු ගෙවීම් ප්‍රමාද කරන/ පැහැර හරින ආයතන සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධ විධිමත් ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| (x) | ආයතන 06 ක් විසින් 2017/18 වර්ෂය සඳහා මෙම රු.2,386,165 ක භෝග රක්ෂණ බද්ද හා ඒ මත ගණනය කර තිබූ රු.270.313 ක දඩ මුදල්, විගණිත දිනය වූ 2019 අගෝස්තු 30 දින වන විටත් අයකර ගෙන නොතිබූ බවත් එම දඩ මුදල් අයකර ගැනීමට අරමුදල විසින් ඉදිරි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබූ බවත් නියැදි පදනම මත සිදුකල පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | විමසුමෙහි දක්වා ඇති ආයතන විසින් 2017/2018 වර්ෂ සදහා බෝග රක්‍ෂණ බද්ද හා ඒ මත ගණනය කර තිබූ දඩ මුදල් විගණන දිනය වූ 2019 අගෝස්තු 30 වන විටත් අයකර ගෙන නොතිබුණු අතර එම ආයතන සඳහා සිහිකැඳවීම් ලිපි යැවීමට මණ්ඩලය විසින් කටයුතු කර ඇත. | ආදායම් කඩිනමින් අයකර ගැනීමට ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු වීම. |
| (xi) | 2018 දෙසැම්බර් 31 දිනට අරමුදලට අදාළව නොවිසඳුණු නඩු 189 ක් පැවතුණු අතර ඒ වෙනුවෙන් ඉල්ලුම් කල ප්‍රතිෂ්ඨාවන්හි මුළු වටිනාකම රු. 773,579,952 ක් වූ අතර සමහර නඩු වසර ගණනාවක සිට ඉදිරියට එමින් පවතින බව නිරීක්ෂණය විය. | නඩු කටයුත්තක් පැවරූ දින සිට ගරු අධිකරණය විසින් අවසන් නියෝගය ලබා දෙන දිනය දක්වා අනුගමනය කළයුතු පියවර ගණනාවක් පවතින අතර එකී පියවර අභිබවා අප නීති අංශයට නඩු කටයුතු අවසන් කිරීමේ හැකියාවක් නොමැත. | නොවිසඳුණු නඩු සම්බන්ධව විශේෂ අවධානයක් යොමුවිය යුතු වීම. |
| (xii) | **ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යසාධනය**<br>අරමුදලේ එක් එක් අංශ යටතේ ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යසාධනය පහත පරිදි විය.<br>**I. ප්‍රතිරක්ෂණ අංශය** | | |
| | i. ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රතිරක්ෂණ අංශය මඟින් 2018 වර්ෂයේ මෝටර් හා මෝටර් නොවන සාමාන්‍ය රක්ෂණ සඳහා ප්‍රතිරක්ෂණය කිරීමට සැලසුම්කර තිබුණු අතර එම කාර්යය විගණිත දිනය වන විටත් අවසන් කිරීමට අරමුදල අපොහොසත් වී තිබුණි. | 2019/2020 වර්ෂය සඳහා මෝටර් හා මෝටර් නොවන සාමාන්‍ය රක්‍ෂණය සඳහා ප්‍රතිරක්‍ෂණය ලබා ගැනීම සඳහා වන ප්‍රසම්පාදන කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතී | ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යයන් විධිමත් පරිදි නිම කළ යුතු වීම. |
| | ii. ප්‍රතිරක්ෂණාවරණ හා වන්දි ගෙවීම් ක්‍රියාවලිය පද්ධති වාර්තාවක් ලබාදීම ද ඇතුලත්ව ස්වයංක්‍රීයකරණය | ප්‍රතිරක්‍ෂණාවරණ කටයුතු සහ වන්දි ගෙවීමේ ක්‍රියාවලියේ ද, 75% පමණ ප්‍රමාණයක් ස්වයංක්‍රීයකරණය කර ඇති අතර වන්දි ගෙවීම් වල ඇති විවිධත්වය හා සංකීර්ණත්වය හේතු කොට ගෙන සමහර ගෙවීම් සඳහා අවශ්‍ය | ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යයන් නිම |

| | | | |
|---|---|---|---|
| | කිරීම සඳහා සැලසුම් කර තිබුණු නමුත් විගණිත දිනය වන විටත් එම කාර්යය ආරම්භ කර නොතිබුණි. | ක්‍රියාවලිය Manual ක්‍රමයට තවමත් කරගෙන යන අතර එම ගෙවීම් කටයුතු සඳහා Manual ක්‍රමය භාවිත කිරීම දැනට පවතින පද්ධතියට සාපේක්ෂව පහසුබව සහ නිරවද්‍ය බව තහවුරු කරමු. | කළ යුතු වීම. |
| iii. | 2018 වර්ෂය සඳහා ප්‍රතිරක්ෂණාවරණ පිළිබඳ ජත්‍යන්තර මට්ටමින් දැනුවත් කිරීමේ සමුළු 01 ක් ද, දේශීය මට්ටමින් දැනුවත් කිරීමේ සමුළු 04 ක් ද (කාර්තුවකට එක බැගින්) පැවැත්වීමට සැලසුම් කර තිබුණද විගණිත දිනය වූ 2019 මැයි 14 දින වන විටත් දැනුවත් කිරීමේ එක් වැඩසටහනක් හෝ පවත්වා නොතිබුණු බව නිරීක්ෂණය විය. | ප්‍රතිරක්ෂණාවරණ සඳහා වන ප්‍රසම්පාදන වර්ගයන් 4ක් 2018 වර්ෂයේ දී සිදුකල අතර, ඒවා වඩා ප්‍රායෝගිකව පුළුල්වත් සියලු තාක්ෂණික දැනුම සොයා උපයෝගී කොට ගෙන එම ක්‍රියාවලීන් සම්පූර්ණ කිරීමට උපරිම දායකත්වය උත්සාහය යෙදවීමට සිදු වීම නිසා එහි ඇති අනිවාර්ය අවශ්‍යතාවය නිසාත් මෙවැනි දැනුවත් කිරීමේ වැඩසටහන් වලට වැඩි කාලයක් කැප කිරීමට නොහැකි විය | ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යයන් නිම කළ යුතු වීම. |
| **II.** | **සාමාන්‍ය රක්ෂණය - මෝටර් නොවන** | | |
| i. | 2017 වර්ෂය තුල ඒකාබද්ධ විදේශ රක්ෂණ ඔප්පුවක් එනම් පවතින රක්ෂණාවරණය පුළුල් කිරීමට සැලසුම් කර තිබුණද එය 2018 වර්ෂය තුල හෝ ක්‍රියාත්මක නොකොට 2019 වසර දක්වා කාලරාමුව දීර්ඝ කර තිබුණි. | 2017 වර්ෂය තුළ සැලසුම් කර තිබූ විදේශ රක්ෂණ ඔප්පුව පුළුල් කිරීම සඳහා 2017 වර්ෂය තුළදී ප්‍රතිරක්ෂණාවරණයක් ලබා ගැනීමට නොහැකි වූ අතර මේ වන විටත් ඒ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කටයුතු සිදුකර ගෙන යනු ලැබේ. | ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යයන් නිම කළ යුතු වීම. |
| ii. | අග්‍රහාර රක්ෂණාවරණය මඟින්, පොදු සෞඛ්‍ය යෝජනා ක්‍රමයක් කොටස් වශයෙන් සෑම ක්ෂේත්‍රයක් වෙනුවෙන්ම පිහිටුවීමට සැලසුම් කර තිබුණද, අර්ධ රාජ්‍ය අංශයෙහි පමණක් එකී කටයුතු ආරම්භ කර තිබුණු අතර පෞද්ගලික අංශයන්හි දායකත්වයක් ලබාගෙන නොතිබුණි. | 2016ට පෙර විශ්‍රාම ගිය විශ්‍රාමිකයන් සඳහා අග්‍රහාර රක්ෂණාවරණය ලබා දීම සඳහා 2018 වර්ෂයේ දි මූලිකත්වය ගෙන කටයුතු කළ අතර දැනට ඒ සඳහා කැබිනට් අනුමැතිය සඳහා ඉදිරිපත් කොට ඇති අතර අයවැයෙන් ඒ සඳහා මුදල් වෙන් කිරීමෙන් ද පසු එය ක්‍රියාත්මක කිරීමට නියමිතය. | ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යයන් නිම කළ යුතු වීම. |

**III. මූල්‍ය අංශය**

| | | |
|---|---|---|
| අරමුදල, ප්‍රතිරක්ෂණය හා සාමාන්‍ය රක්ෂණය ලෙස වෙන් කිරීමට 2017 වර්ෂයේදී සැලසුම් කර තිබුණද එම කටයුතු 2019 වර්ෂය වන විටත් අවසන් කර නොතිබුණි. | රාජ්‍ය මූල්‍ය ක්ෂේත්‍ර ප්‍රතිව්‍යුහගතකරණය කිරීම ලෝක බැංකු නියෝජිතයන් සමඟ එක් වී සිදු කරන බැවින් ඔවුන්ගේ ක්‍රියාකාරී සැලසුම්වලට අනුකූල වන ලෙස කටයුතු කිරීමේදී අදාළ සැලසුම් අදහස් කළ පරිදි එම කාල සීමාව තුළ අවසන් කිරීමට නොහැකි වී ඇත. | ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යයන් නිම කළ යුතු වීම. |

**IV. ස්වාභාවික ආපදා**

| | | |
|---|---|---|
| මෙම අංශය මඟින් රක්ෂණ කර්මාන්තය සඳහා ස්වභාවික ආපදා සංචිතයක් (Disaster Pool) නිර්මාණය කිරීමට සැලසුම් කර තිබුණු අතර ඒ මඟින් ප්‍රධාන විධායක නිලධාරී සඳහා තොරතුරු වාර්තාවක් ලබාදීමට ද එම සංචිතයෙන් ලැබෙන වාසි පිළිබඳ රක්ෂණ කර්මාන්තය දැනුවත් කිරීමට ද ශ්‍රේණිගත කිරීමද , ස්වාභාවික ආපදා සංචිත සඳහා රාමුවක් සකස් කිරීම් ද, තාක්ෂණික ඇඟයීම් කමිටුවක් ඇති කිරීම් යනාදී ක්‍රියාකාරකම් කිරීමට අපේක්ෂා කර තිබුණි. එසේ වුවද, විගණිත දිනය වූ 2019 මැයි 14 දින වන විටත් මීට අදාලව කිසිදු කාර්යයක් ඉටුකර නොතිබුණි. | අදාළ ස්වාභාවික ආපදා සම්බන්ධයෙන් රක්‍ෂණ මූල්‍ය සංචිතයක් පවත්වාගෙන යාම සඳහා යෝජනා කළ ද රක්‍ෂණ ක්‍ෂේත්‍රයේ සෘණාත්මක ප්‍රතිචාර හමුවේ මෙය ක්‍රියාත්මක වී නොමැත. තව දුරටත් මේ සම්බන්ධව කටයුතු කිරීමට උත්සාහ කරනු ලැබේ. | ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යයන් නිම කළ යුතු වීම. |

**V. කෘෂි රක්ෂණය හා ක්ෂුද්‍ර රක්ෂණය**

| | | |
|---|---|---|
| 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනත පිහිටුවීමේ ප්‍රධාන අරමුණක් වූ ක්ෂුද්‍ර රක්ෂණය මඟින් සංක්‍රමණික සේවකයන් ද පංශු සම්පත් හා ස්වයං රැකියාවල නියුතු පුද්ගලයින්, වතු කම්කරුවන් හා ගොවීන් ආවරණය වන ලෙස රක්ෂණාවරණ හඳුන්වාදීමට සැලසුම්කර තිබුණද විගණිත දිනය වන විටත් ඒ සඳහා කටයුතු කර නොතිබුණි. | සංක්‍රමණික සේවකයන් සඳහා රක්‍ෂණ කටයුතු සිදු කළයුතු වන්නේ, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශය හරහා බැවින් එම ආයතනයෙන් මිල ගණන් කැඳවීමක් සිදුකල යුතු වේ.<br><br>"ගොවි දිවි අරුණ රක්‍ෂණාවරණය" ගොවීන් සඳහා රක්‍ෂණාවරණයක් ලෙස හදුන්වා දී ඇති අතර නියමු ව්‍යාපෘතියක් ලෙස අනුරාධපුර ශාඛාව මගින් ක්‍රියාත්මක වෙමින් පවතින අතර අනෙකුත් ශාඛාවන් හරහා ද ක්‍රියාත්මක කිරීමට ඉදිරියේ දී කටයුතු කරමු.<br>වගා බද්ද උපයෝගී කරගනිමින් වගා හානි වෙනුවෙන් ගොවීන් සඳහා ගෙවීම් කටයුතු සිදු කිරීමට කෘෂි රක්‍ෂණ මණ්ඩලය වෙත ද ප්‍රතිපාදන ලබා දේ. | ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යයන් නිම කළ යුතු වීම. |

## VI. තොරතුරු තාක්ෂණ අංශය

| | | |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව තොරතුරු තාක්ෂණ අංශය සඳහා නව පද්ධතියක් ස්ථාපිත කිරීමට හා ගෙන තිබුණු අතර, ඒ වෙනුවෙන් සමාලෝචනයක් සිදු කිරීම, අඩුලුහුඩුකම් තීරණය කිරීම බාහිර සම්පත් යොදා ගනිමින් මේ සම්බන්ධව ඇගයීමක් සිදුකිරීම් ආදිය සැලසුම් කර තිබුණද ඊට අදාල ඉදිරි පියවර කිසිවක් ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අදාළ උපදේශන සේවා ලබා දීම සඳහා මොරටුව විශ්ව විද්‍යාලය එකග වී ඒ සඳහා වන යෝජනා පත්‍රයක් අප වෙත ඉදිරිපත් කිරීමට ඔවුන් විසින් එකග වුණි. ඒ අනුව ඔවුන් විසින් ලබා දෙන යෝජනා පත්‍රය අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඒ සඳහා වන ඉදිරි කටයුතු කරගෙන යනු ඇත. | ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යයන් නිම කළ යුතු වීම. |

## 2.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | අරමුදල හා ප්‍රතිරක්ෂණ ආයතනය සමඟ 2018.03.31 දින සිට 2019.03.31 දින දක්වා ප්‍රතිරක්ෂණ ගිවිසුමකට එළඹ තිබුණ අතර වර්ෂය තුළ ඒ සඳහා රු. 98,670,792 ක මුදලක් ගෙවා තිබුණි. එසේ වුවද, එම ප්‍රතිරක්ෂණ ගිවිසුම හා ප්‍රතිරක්ෂක තෝරා ගැනීමට අදාල ප්‍රසම්පාදන තොරතුරු අරමුදල සතුව නොපැවතුණි. | 2018 මාර්තු 27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 18/0524/728/017 ටීබීආර් යටතේ ප්‍රතිරක්ෂණයක් ලබාගැනීම තුළින් 30% ක වගකීම ජාතික රක්ෂණ භාර අරමුදලම ප්‍රේෂණය කොට ඇත. එම ප්‍රතිරක්ෂණ ගිවිසුම සහ ප්‍රතිරක්ෂක තෝරා ගැනීමට අදාළ ප්‍රසම්පාදන ලිපි ගොනු කෘෂි කාර්මික හා ගොවිජන මණ්ඩලය සතු වේ. එබැවින් ඒ පිළිබඳව එම ආයතනයෙන් ලබා ගත හැක. | අදාළ සියළු වැදගත් ලේඛන පවත්වා ගත යුතු වීම. |
| (ii) | 2018 වර්ෂයේදී රු. 1,838,208 ක පිරිවැයක් දරා ස්ථාවර වත්කම් භෞතික පරීක්ෂාවක් හා ප්‍රත්‍යාගණනයක් සිදු කර තිබූ අතර මේ සම්බන්ධව 2017 හෝ 2018 වර්ෂවල ප්‍රසම්පාදන සැලසුම්වල ඇතුලත් කර නොතිබුණි. ලංසු කැඳවූ ලේඛනයේ ඇතුළත් තොරතුරු අනුව, මිල ගණන් කැඳවීම් ලිපි ආයතන 05 කට යවා තිබුණද එම ආයතන තෝරා ගත් පදනම විගණනයේදී පැහැදිලි නොවීය. | වත්කම් ප්‍රත්‍යාගණනය හා ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවය ඉතා වැදගත් බැවින් ප්‍රසම්පාදන සැලසුමේ නොතිබුණ ද එය ක්‍රියාවට නංවන ලදී. ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ විගණකවරුන් පස්දෙනකුගෙන් යෝජනා කැඳවා තිබුණි. නියමිත කාලය තුළදි මිල ගණන් ලැබී නොමැති වීම හේතුවෙන් මිල ගණන් ඉදිරිපත් කිරීමට ලබා දී තිබුණු කාලය දීර්ඝ කිරීමට සිදු විය.<br><br>තාක්‍ෂණික ඇගයීම් කමිටුව මගින් නිර්දේශ කර තිබුණු "Coding System" හා ස්ථාවර වත්කම් රෙජිස්ටරයක් සකස් කර ගැනීම සඳහා නැවත මිල ගණන් ඉදිරිපත් කරන ලෙස දන්වා ඒ අනුව කටයුතු කර ඇත. | නීතිරීතිවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |

2017 ජූලි 10 දින මිල ගණන් කැඳවූ මෙම ප්‍රසම්පාදන කාර්යයෙහි ලංසුකරුවෙකු තෝරා ගැනීම 2018 ජනවාරි 23 දින එනම් මාස 06 කට පසු සිදුව ඇති බව නිරීක්ෂණය විය.

## 2.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| i. 2018 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 05 ක පුරප්පාඩු පැවති අතර ඒ තුළ සහකාර සාමාන්‍යාධිකාරී තනතුරක්, කළමනාකරු තනතුරු 03 ක් හා අභ්‍යන්තර විගණන තනතුරක් ඇතුළත් විය. අනුමත අභ්‍යන්තර විගණක තනතුරද ඇතුලත්ව ඉහත කී තනතුරු සඳහා ස්ථිර නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කර නොමැති බව 2016 හා 2017 වර්ෂයන්හි විගණන විමසුම් තුළින්ද පෙන්වා දී තිබුණද, එසේ ක්‍රියා නොකොට එකී තනතුරු සඳහා 2018 සැප්තැම්බර් සිට මේ දක්වා වැඩ බැලීමේ පදනම මත තනතුරු පිරවීමට අරමුදල ක්‍රියාකර තිබුණි. | මේ සියළු නිළධාරීන් කළමණාකරුවන් සඳහා අවශ්‍ය සියළු අධ්‍යාපන සුදුසුකම් හා විෂය පළපුරුද්ද මනාව ඇති අතර බඳවා ගැනීමේ පටිපාටියේ ඉල්ලා ඇති වසර 15 ක සේවා කාලය නොමැතිකම නිසාම පමණක් ඔවුන් වැඩබලන කළමණාකරු තනතුරෙහි පිහිටා ඇත. නමුත් රක්ෂණ ක්ෂේත්‍රයේ කළමණාකරුවකු පත්කිරීම සඳහා අවශ්‍ය වන සේවා කාලය සංශෝධනය කර ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සහ වැටුප් තල සැකසීමේ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමු. | ස්ථිර නිලධාරීන් බඳවා ගැනීමට ක්‍රියා කළ යුතු වීම |
| ii. ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 13.3ඡේදය ප්‍රකාරව වැඩ බැලීමේ පත්වීමක් කල යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණි .එම තනතුරට පූර්ණ කාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය නම් නිත්‍ය පත්වීමක් නොපමාව කලයුතු වූවත් තනතුරු 04 ක් 2018 සැප්තැම්බර් සිට මේ දක්වා වැඩ බැලීමේ පදනම මත පත්වීම් සිදු කර තිබීම හේතුවෙන් එය ආයතන සංග්‍රහයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවීය . | | ස්ථිර නිලධාරීන් බඳවා ගැනීමට ක්‍රියා කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| iii. | තෘතීයික හා ද්විතීයික මට්ටම්වල එකතුව 31 ක් වූ තනතුරු පුරප්පාඩු පැවතුණු අතර එම තනතුරු විගණිත දිනය වූ 2019 ජූලි 31 දින වන විටත් පිරවීමට කටයුතු කර නොතිබුණි. | සහකාර කළමණාකරු 2019.09.02 වන දින සිට බඳවා ගෙන ඇත. අවදානම් කළමනාකරණ- ඉංජිනේරු තනතුරට අදාළව සම්මුඛ පරීක්ෂණ පවත්වා අවසන්ව ඇත. ආයුගණක කළමණාකරු තනතුර සඳහා අයදුම්පත් කැඳවීම සඳහා පුවත්පත් දැන්වීම් පළකර ඇත.<br>ඉතිරි තනතුරු ඉදිරියේ දී ආයතනික අවශ්‍යතාවයන් මත සුදුසුකම් සහිත පුද්ගලයන් බඳවා ගැනීමට කටයුතු කරනු ඇත. | ස්ථිර නිලධාරීන් බඳවා ගැනීමට ක්‍රියා කළ යුතු වීම. |
| iv. | තෘතීයික මට්ටමේ පුරප්පාඩු තනතුරු 04අතුරින් 2017 ,වර්ෂයේදී බඳවා ගැනීමේ පටිපාටි අනුමත වී තිබූ ආයුගණක (Actuarial) ,කළමනාකරු හා අවධානම් අංශයෙහි ඉංජිනේරු තනතුරු සඳහා අනුමත කාර්ය පිරිවිතරයන් අනුව, එම තනතුරු අරමුදලේ කටයුතු සඳහා අත්‍යවශ්‍ය තනතුරු වූ අතර 2006 වර්ෂයේ සිට රක්ෂණ ක්ෂේත්‍රයේ නියැලි සිටින අරමුදල විසින් මෙකී පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි . | ඒ අනුව අප විසින් අවදානම් කළමණාකරණ ඉංජිනේරු සඳහා පුවත්පත් දැන්වීම් පළකර මේ වන විට ඒ සඳහා සුදුසුකම් සහිත අයදුම්කරුවන් තෝරාගෙන ඇත.<br>එමෙන්ම මේ වන විට ආයුගණක කළමණාකරු තනතුර සඳහා අයදුම්පත් කැඳවීම සඳහා පුවත්පත් දැන්වීම් පළකර ඇත. | අනුමත තනතුරු පුරප්පාඩු හැකි ඉක්මනින් පිරවීමට ක්‍රියා කළ යුතු වීම. |